රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 35/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 සැප්තැම්බර් මස 27 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**උපාධිධාරී ස්ථාපන සේවය- 1983 පෙබරවාරි මස 18 දිනැති අංක 215 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන.**

1983 පෙබරවාරි මස 18 දිනැති අංක 215 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

02. එහි 02 ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරන්න.

"02. 03 වැනි ඡේදයේ දැක්වෙන සේවා සහ තනතුරු හැර, අවමය වශයෙන් හෝ විකල්පයක් වශයෙන් හෝ උපාධියක් සුදුසුකමක් වන්නා වූ, රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ ඇති සියළුම තනතුරු සඳහා (03(අ) ඡේදයේ සඳහන් වැටුප්තල වෙනුවට ඊට අනුරූප 1988 වැටුප් තල යොදාගත යුතුය.) බඳවා ගැනීම් කළයුතු වන්නේ උපාධිධාරී ස්ථාපන සේවය මගිනි.

එසේ වුවද, 1982 ට පසුව උපාධිය සමත්ව රැකියා විරහිතව සිටින බාහිර උපාධිධාරියකු බඳවා ගැනීමට අදහස් කරන යම් රාජ්‍ය ආයතනයක් ඒ සඳහා යොවන රැකියා සැලසුම් අධ්‍යක්ෂගේ පූර්ව අනුමතිය ලබාගත යුතුය.

රාජ්‍ය ආයතන එසේ පූර්ව අනුමතිය ඉල්ලන විට බාහිර උපාධිධාරීන් සඳහා පුරප්පාඩුවලින් කවර කොටසක් වෙන් කරන්නේ දැයි දැන්විය යුතුය."

03. එහි 04 වන ඡේදයේ අවසානයට පහත සඳහන් ඡේදය එකතු කරන්න.

"ඉහත 02 වන ඡේදය අනුව පූර්ව අනුමතිය ලබාගෙන ඇත්නම්, 1982 ට පසු බාහිර උපාධිධාරීන් වශයෙන් උපාධිය ලබා රැකියා විරහිතව සිටින්නන්ගෙන් ඉල්ලුම්පත් කැඳවිය යුතුය.

අභ්‍යන්තර උපාධිධාරීන් ඉල්ලුම් කිරීම අනවශ්‍ය බවත්, උපාධිධාරී ස්ථාපන සේවය නම්කරන අභ්‍යන්තර උපාධිධාරීන් සමග, සුදුසුකම් ලත් බාහිර උපාධිධාරීන් ද සලකා බලන බවත්, දැන්වීමේදී සඳහන් කළ යුතුය."

(එම්. එච්. සයිඩ්)
වැඩ බලන ලේකම්,